# 18 පන්සිල්

එක දවසක් මහානාම කියල සාක්‍ය රජ කෙනෙක් බුදුහාමුදුරුවන් හමුවෙන්න ආවා. ඇවිත් උන්වහන්සේට නමස්කාර කරල එකත් පසෙකට වී උන්වහන්සේගෙන් ප්‍රශ්නයක් ඇහුවා.



''බුදුහාමුදුරුවනේ, තෙරුවන් සරණ ගිය උපාසකයා සිල්වතෙක් වන්නේ කොහොමද?

මහානාම රජතුමා ඇසූ ප්‍රශ්නය එය යි. අපේ බුදුහාමුදුරුවෝ ඊට දීපු උත්තරය තමයි...

''රජතුමනි, පන්සිල් සමාදන් වීමෙන් සිල්වතෙක් විය හැකිය'' යන්න.

බුදුහාමුදුරුවො පෙන්නල දුන්න දහමට අනුව ගිහියකු වශයෙන් තෙරුවන් සරණ ගිය සෑම අයකු ම දෙවනුව වැරදි පහකින් ආරක්‍ෂා විය යුතු ය.

''පන්සිල්'' යනුවෙන් හැඳින්වෙන්නේ ඒ වැරදි පහයි.

අපි ඒ පන්සිල් තේරුමත් සමග ඉගෙන ගනිමු.

## පන්සිල්

පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
අදින්නාදානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
කාමෙසු මිච්ඡාචාරා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
මුසාවාදා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි

## තේරුම

(මම) පණ නැසීමෙන් වැළකීමේ සිකපදය සමාදන් වෙමි.
(මම) නොදුන් දේ ගැනීමෙන් වැළකීමේ සිකපදය සමාදන් වෙමි.
(මම) කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීමේ සිකපදය සමාදන් වෙමි.
(මම) බොරු කීමෙන් වැළකීමේ සිකපදය සමාදන් වෙමි.
(මම) මදයට හා ප්‍රමාදයට හේතුවන මත්ද්‍රව්‍යවලින් වැළකීමේ සිකපදය සමාදන් වෙමි.

## අවබෝධය

| | |
|---|---|
| පණ නැසීම | තමන්ගේ මෙන් ම අනුන්ගේ ප්‍රාණය දැන දැන විනාශ කිරීම පණ නැසීමයි. |
| නුදුන් දේ ගැනීම | මෙයින් අදහස් කරන්නේ සොරකමයි. තමන්ට අයත් නොවන හා තමන්ට නුදුන් දෙයක් අවසරයෙන් තොරව ගැනීමයි. |
| කාමයෙහි වරදවා හැසිරීම | සිය අඹු, සිය සැමි ඉක්මවා පර සැමි, පර අඹු සමග කම් සුව විඳීමයි. |

| | |
|---|---|
| බොරුකීම | වචනය මූලික කරගෙන අනුන් රැවටීම බොරුවයි. නැති දේ ඇති විදිහටත් ඇති දේ නැති විදිහටත් වෙනස් කර කීමෙන් අනුන් රැවටිය හැක. |
| මත්ද්‍රව්‍ය භාවිතය | මත්වීමට, සිහිය විකල් වීමට (මජ්ජ) හේතුවන හා සියලු කටයුතු අවුල් වී ප්‍රමාදයට (පමාද) හේතු වන විවිධ දියර, කුඩු, දුම් වැනි දේ පාවිච්චි කිරීමයි. |

බුදුසසුනට ඇතුළත් වුණු උපාසකයෙක්, උපාසිකාවක් පන්සිල් රැකීමෙන් ලොවට මහ සෙතක් සලසනවා. තමාගෙන් කිසිවෙකුට බියක් නැතිබව, වෛරයක් නැතිබව, දුක් පීඩාවක් නැතිබව මේ වැරදි පහෙන් වළකිණ උපාසකයා ඔප්පු කරනවා. එයින් ඔහුට හෝ ඇයට සමාජයේ බයක් නැතිව, වෛරයට ලක් නොවී දුක් පීඩා නොවිඳ ඉන්නට ලැබෙනවා. පන්සිල්, ගිහියකුට වටින්නෙ ඒ නිස යි. ගිහියන්ගේ නිත්‍ය සීලය යනුවෙන් ද හඳුන්වන්නේ ඒ නිස යි.

## ක්‍රියාකාරකම 18.1

අර්ථයට සමාන වැකි ඉරකින් යා කරන්න.

| | |
|---|---|
| බුදුහු කරුණු පහදා දුන්හ. | රාහුල හිමි පිරිවණට නොගියේ බොරු හිසේ අමාරුවක් අරගෙනය. |
| බස් කොන්දොස්තර මහතා දුන් ඉතිරි මුදල අඩු ය. | එවිට පස් පවින් වැළකිය හැකි ය. |
| අනුන් රැවටීම හොඳ නෑ | අහිංසක අංගුලිමාල මිනිසුන් මැරුවේ ය. |
| අපි පන්සිල් රකිමු. | මහානාම රජු ප්‍රශ්න කළා. |
| පණ නැසීම පාපයකි. | මත් පැන් පානය කළ නිසා ද? |